**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය**

**ර/කොස්වත්ත ගාමිණී ම. ම. විද්‍යාලය**

**සැකසුම : බී. ඩී. දසුන් රාජිත දන්වත්ත**

## ජනමාධ්‍යයේ කාර්යය භාරය

- පොදුවේ අප සන්නිවේදනයේ කාර්යය ලෙස හඳුනා ගන්නා කාර්යයන් ජනසන්නිවේදනයේදී අදාළ වේ. එහෙත් එය පුළුල් වූ ක්‍රියාවලියක් වෙයි.
  යුනෙස්කෝ Many Voices One World කෘතිය තුළ ජනමාධ්‍යයේ කාර්යය භාරය කිහිපයක් පෙන්වා දී ඇත.
  1. සුපරික්ෂණය
  2. අර්ථකථනය
  3. සහසම්බන්ධය
  4. සමාජානුයෝජනය

මීට අමතරව සන්නිවේදනයේ විද්වතුන් දෙදෙනෙක් වන විල්බර් ශ්‍රාම් සහ හැරල්ඩ් ලැස්වෙල්ද සන්නිවේදනය තුළ ජනමාධ්‍යයේ කාර්යභාරය පෙන්වා දී ඇත.

ඊටත් අමතරව තවත් කරුණු කිහිපයක්ද දැකගත හැක.

ඒ අනුව ජනමාධ්‍යයේ කාර්යභාරය පිළිබඳව අංශ හතරකින් කරුණු ගෙන හැර දැක්වේ.

1. යුනෙස්කෝ Many Voice One World කෘතියට අනුව
2. හැරල්ඩ් ඩී. ලැස්වෙල්ට අනුව
3. විල්බර් ශ්‍රාම් ට අනුව
4. අනෙකුත් කරුණු

මේ අංශ හතර වෙන වෙනම ගෙනහැර බැලීම හරහා මෙය සරළව වටහාගත හැක.



හැරල්ඩ් D ලැස්වෙල්

### 01. යුනෙස්කෝ Many Voice One World කෘතියට අනුව

❖ **සුපරික්ෂණය**

සමාජය තුළ ජිවත්වන පුද්ගලයා දැනගත යුතු තොරතුරු එක්රැස් කිරීම මෙන්ම ආරක්ෂණ තොරතුරු පිළිබඳ දැනුවත් කිරීම, සමාජ අවශ්‍යතා , ආපදා තොරතුරු එක්රැස් කිරීම සහ කඩිනමින් ඒවා පිළිබඳව ජනතාව දැනුවත් කිරීම ආදිය මෙයට ඇතුළත් වේ.
ජනමාධ්‍ය මගින් සමාජයේ සිදුවන සමාජයට හිතකර හෝ අහිතකර බලපෑම් පිළිබඳ අවධානයෙන් සිට ඒවා හෙළිදරව් කිරීමට මැදිහත් වීමද සුපරික්ෂණයට අයත්ය.

වර්තමානයේ මාධ්‍යය තුළින් ඒවාට ඕනෑතරම් උදාහරණ ඇත.

- පොල්තෙල්වල විෂ රසායන ඇති බවට මාධ්‍ය මගින් හෙළි කිරීම.
- නිරන්තර සිදුවන වැලි ජාවාරම් පිළිබඳ අවධාරණය කිරීම.
- කොරෝනා වසංගතය පිළිබඳ සමාජය දැනුවත් කිරීම.

මෙවැනි උදාහරණ සුපරික්ෂණයට අදාලව ජනමාධ්‍යයෙන් දැකගත හැකිය.

තවද ආපදා සිදුවීම් පූර්වයෙහි හිමිවීමද මෙයට අයත්ය.




- හිරු C I A
- දෙරණ උකුස්සා
- සිරස විමර්ශණ
- නෙත් Fm බැළුම්ගල වැනි වැඩසටහන්ද මෙයට ආදලව දැකගත හැකිය

❖ ***අර්ථකථනය***

මෙහිදි සිදුවන්නේ ග්‍රාහකයා වෙනුවෙන් යම් දෙයක අර්ථය පැහැදිලි කර දීමයි. විවිධ සිදුවීම් මෙන්ම තොරතුරුද නිරන්තරයෙන් මාධ්‍ය හරහා ප්‍රචාරය වෙයි. ඒවායේ සැබෑ ස්වරූපය හෙවත් සැබෑ අර්ථය පැහැදිලි කිරීම විවරණය කිරීම මෙන්ම සමාජීය ප්‍රතිචාර ලබා ගනිමින් තොරතුරු විශ්ලේෂණය කිරීමද මීට අයත් ය. යමක් අර්ථකථනය කිරීමට පෙර ප්‍රමාණවත් දැනුමක් තිබිය යුතුය.
එමගින් කෙනෙකු සතු අත්දැකීම් පවා අර්ථකථනය කළ හැකිය. චර්යාව අර්ථකථනයක් මෙහිදි වැදගත් වෙයි. විකල්ප මාධ්‍යයේ අරමුණද මීට සමාන වෙයි.

❖ **සහසම්බන්ධය**

සමාජයේ විවිධ පාර්ශව එකට මුණගැසෙන හා මුණගස්වන වේදිකාවක් ලෙස ජනමාධ්‍ය හඳුනාගත හැකිය.




- ජනතාව හා පාලකයින්
- ජනතාව හා නිලධාරීන්
- පාරිභෝගිකයින් හා වෙළෙඳුන්
- රසිකයන් හා කලාකරුවන්

ජනමාධ්‍ය තුළ කලාකරුවන් මේ ආදී නොයෙක් චරිත ජනමාධ්‍ය තුළ සහසම්බන්ධතා පවත්වයි.
මෙය තවදුරටත් විග්‍රහ කරන්නේනම් ජනමාධ්‍ය සන්දේශ මගින් පුද්ගලයන් සහ ආයතන අතර අන්‍යොන්‍ය සම්බන්ධතාව ගොඩනැගීම ප්‍රධාන වශයෙන් සහසම්බන්ධයේදි සිදුවේ. සමත්ව ස්ථිරව පවත්වාගෙන යාමට එය උපකාරී වේ.

- ඩෙනිස් මැක්වෙල්ට අනුව සහසම්බන්ධයෙන් අපේක්ෂිත කරුණු කිහිපයකි.

  - සමාජානුයෝජනය
  - සම්මුති ගොඩ නැගීම
  - අර්ථ විවරණය කිරීම
  - ප්‍රමුඛතාවල වැදගත්කම පෙන්වීම
  - විවිධ කටයුතු සම්බන්ධිකරණය කිරීම.

❖ **සමාජානුයෝජනය**

පුද්ගලයාට තමා ජීවත්වන සමාජයට අනුගතව හැසිරීම පිළිබඳ ඉගෙනුම , සමාජය පිළිබඳ දැනුම හා වටිනාකම් ඉදිරිපත් කිරීම , ඒවා ජනතාව වෙන ලබාදීම හා සමාජයේ පොදු ගැටලු හා අභියෝග හඳුනා ගැනීමට සැලැස්වීම ජනමාධ්‍යයේ සමාජ කාර්යයකි.

පවුල ⟶ පාසල ⟶ සම වයස් කණ්ඩායම් ⟶ ''ජනමාධ්‍යය " හරහා පුද්ගලයා සමාජානුයෝජනය වෙයි.
නිවැරදි ලෙස පුද්ගලයා සමාජගත කිරීමට ජනමාධ්‍යයට විශාල හැකියාවක් ඇත.

උදා: කොරෝනා වසංගතය සමග ජනතාව සෞඛ්‍යය නීති පිළිපැදීම ගැන දැනුවත් කිරීම යන කරුණු තුළ

ජනමාධ්‍ය සුවිශේෂී කාර්යයක් කරයි. එහිදී ජනමාධ්‍ය පරිශීලනය කරන දරුවාගේ සිට වැඩිමහල්ලා දක්වා සමාජානුයෝජනයක නිරත වෙයි.


එහෙත් ජනමාධ්‍යයෙන් සමාජානුයෝජන ක්‍රියාවලිය හරහා පුද්ගලයා මත සමාජානුයෝජකයක් වන බව පැවසුව ද වර්තමානයේ ජනමාධ්‍යයේ එය කෙතරම් දුරට සාක්ෂාත්වේද යන්න ගැටළුවකි.

**02. ජනමාධ්‍ය කාර්ය භාරය පිළිබඳ ව හැරල්ඩ් ඩී. ලැස්වෙල් මෙලෙස දක්වයි.**

1. සුපරීක්ෂණය
2. ප්‍රවෘත්ති ලොව පුරා බෙදා හැරීම.
3. ප්‍රේක්ෂක මතය හා අදහස් හැඩගැස්වීමේ හැකියාව.

**03. මහාචාර්ය විල්බර් ශ්‍රාම් ද ජනමාධ්‍ය ඉටු කළ යුතු ප්‍රධාන භූමිකා 03 ක් දක්වයි.**

1. ආරක්ෂකයෙකුගේ භූමිකාව
2. සාකච්ඡා මණ්ඩපයක භූමිකාව
3. ගුරුවරයෙකුගේ භූමිකාව



## 04. වෙනත් කරුණු

❖ **ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මුර සෙබලෙකුගේ භූමිකාව ඉටු කිරීම.**

මෙහිදී සිදුවන්නේ ජනතාව විවිධ ආකාරයෙන් මතුවිය හැකි තර්ජන හා අභියෝග පිළිබඳව අවධානයෙන් සිටීමය. රජයේ ක්‍රියාකාරිත්වය ගැන මෙහිදී වැඩි අවධාවනය යොමු කෙරේ. පාලකයන්ගේ හැසිරීම් හේතුවෙන් පොදුවේ ජන සමාජයට මතුවිය හැකි බලපෑම් පාලනය කිරීම ජනමාධ්‍යයට පැවරී ඇති වගකීමකි. කෙසේ වෙතත් මෙය යථාර්ථවත් දෙයක් බවට පත් වන්නේ ජනමාධ්‍ය න්‍යාය පත්‍රය ජනතා හිතවාදී වුවහොත් පමණි.

❖ **සමකාලින සමාජ විඥානය හඳුනා ගැනිමට උපකාරි විම.**

සමාජය තුළ පවතින විවිධ මතවාද මෙන්ම නව ප්‍රවණතා පිළිබඳ අවබෝධය ලබාදිම මෙමගින් සිදුවෙයි. සිරිත් විරිත් , විලාසිතා , පිවන ක්‍රම, ආහාර පාන ආදිය පිළිබඳ දැනුම සම්පාදනය මෙමගින් ඉටුකර ගත හැකිය. ඉන් නවීනත්වය පිළිබඳ හැඟිමක් පොදු සමාජයට ඇති කරයි.

❖ **ග්‍රාහක රසඥතාව පුළුල් කිරිමට දායක වෙයි.**

සන්නිවේදනයේ මුලික අරමුණක් ලෙස විනෝදය සම්පාදනය පෙන්වා දිය හැකිය. මෙය වඩාත් සාර්ථක වන්නේ දැනුම සමග විනෝදය ලබා දීමෙනි. ග්‍රාහකයා වෙනුවෙන් යම් යම් කරුණු ඉදිරිපත් කිරීමත් ඒවා අර්ථකථනය කිරීමත් මත මෙය වර්ධනය කරගත හැකිය.

❖ **නවෝත්පාදන විසරනය සඳහා තොරතුරු කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම.**

අලුත් නිෂ්පාදන පිළිබඳ අවබෝධය ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කිරිම මෙහි අරමුණයි. සාම්ප්‍රදායික සමාජවල ප්‍රගතිය ඇති කිරිම සඳහා හැකිතාක් විද්‍යානුකූල නව උත්පාදන ක්‍රියාත්මක කළයුතු බව **මහාචාර්ය එවරට් එම් රොජර්ස්** පවසයි. අලුත් නිෂ්පාදන පිළිබඳ ග්‍රාහකයන්ට අවබෝධය ලබා දීමෙන් දියුණුව ඇතිකර ගැනිමත් අපේක්ෂාවයි.

❖ **ඥාන වර්ධනය සඳහා උපයෝගී විම.**

ජනමාධ්‍යවල තොරතුරු සම්පාදනය මෙන්ම අධ්‍යාපනය මගින්ද ඥාන වර්ධනයට අවශ්‍ය සාධක සපයා ගත හැකිය. සමාජය අලුත් දැනුමින් ප්‍රේෂණය කිරීම මෙහි අරමුණයි. එමගින් ජනතාවගේ ආකල්ප හා හැසිරීම් රටාවේ වෙනසක් සිදු කළ හැකිය. මෙය සමාජයේ දියුණුවටද මූලික අවශ්‍යතාවයකි.

මේ හැරෙන්නට සන්නිවේදන ක්ෂේත්‍රයේ සිදුවූ වර්ධනය අනුව ජනමාධ්‍යය කාර්යයන් 2 ක් පෙන්වා දිය හැකිය.



*මහාචාර්යය එවරට් M රොජර්ස්*